**හික්කඩුව නගර සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හික්කඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීමේ දී ලද වට්ටම රු.111,794 ක් ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය වාරික රු.674,708 ක මුදලක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණු කර්මාන්ත 06 ක වටිනාකම වූ රු.2,932,628 ක් මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.135,358 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.4,307,977 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පවතින අසමානතාවයන් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) **ලැබිය යුතු ගිණුම්** | | |
| වර්ෂ 3 සිට 11 දක්වා කාලයක සිට පැවත එන ගිණුම් 4 කට අදාල එකතුව රු.8,719,992 ක් වූ ශේෂයන් සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකර ගනිමි. |
| **(ii) ගෙවිය යුතු ගිණුම්** | | |
| 2012 වර්ෂයේ සිට 2014 දක්වා කාලපරිච්ඡේදයට අදාළව සභාවේ කර්මාන්ත 03 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.760,970 ක කර්මාන්ත ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගනිමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.113,676,949 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 52,200 | වර්ෂ 01 ත් 06 ත් අතර කාලයක සිට පැවත එන තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක PED/A/ 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | සභාව සතු අබලන්ව පවතින බැකෝ ලෝඩර් රථය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | සභාව සතු පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,993,582 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,752,199 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 26,050,000 | 24,668,963 | 22,379,637 | 28,646,334 | 21,878,000 | 24,612,680 | 22,491,576 | 26,357,008 |
| කුලී | 7,036,000 | 6,927,690 | 6,900,143 | 4,696,424 | 8,070,000 | 5,848,146 | 5,847,433 | 4,647,482 |
| බලපත්‍ර ගාස්තු | 1,846,000 | 1,107,260 | 1,243,830 | 362,744 | 1,836,000 | 780,600 | 821,360 | 499,314 |
| | 34,932,000 | 32,703,913 | 30,523,610 | 33,705,502 | 31,784,000 | 31,241,426 | 29,160,369 | 31,503,804 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අය කළයුතු සමස්ත ආදායම රු.64,207,717 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.30,523,610 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 48 ක් ව පැවතුණි. | හිඟ ආදයම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම්

-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂය තුළ රැස් කළයුතු වරිපනම් බදු ආදායම රු.44,927,742 ක් වුවද, රැස්කළ ආදායම රු.16,281,409 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 36 ක් වී තිබුණි. මේ අනුව වරිපනම් බදු අයකිරීම දුර්වල මට්ටමක පැවතුණි. නගර සභා ආඥා පනතේ 170(1) වගන්තිය ප්‍රකාරව අයවිය යුතු වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 කඩ කුලී

----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ රැස් කළයුතු කඩ කුලී ආදායම රු.7,889,962 ක් වුවද, රැස් කළ ආදායම රු.3,193,138 ක් වීමෙන් කඩ කුලී ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 41ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,931,979 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.37,541,692 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ VI වන කොටසේ 153 වගන්තිය පරිදි සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ යුතුකම් ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය ලෙසට සභාවට පෙනී යා හැකි අන්දමේ කාරණා ඉටුකිරීම සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ)** **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභා අරමුදල් යොදවා සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කළයුතු ඇස්තමේන්තු වටිනාකම රු.926,883 ක්වූ කර්මාන්ත 03 ක වැඩ ආරම්භ කර නොතිබුණි. | කර්මාන්තවල වැඩ අවසන් කළ යුතු වේ. | ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමි. |

**(ඇ)** **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය මගින් මහජන ආරක්ෂක පනතේ 42 වන අධිකාරය ප්‍රකාරව කසළ කළමනාකරණය සඳහා සමලෝචිත වර්ෂය සඳහා කිසිදු සැලැස්මක් සහ | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන | 2019 වර්ෂය තුළ කොම්පෝස්-ට් අංගන දෙකක් ඉදිකිරීමට |

| | | |
|---|---|---|
| වැඩපිලිවෙලක් සභාව සතුව නොතිබුණි. | වැඩපිළිවෙලක් අවශ්‍යා වේ. | අපේක්ෂා කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **සේවක ණය** | | |
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් හා තාවකාලිකව සේවය කළ 11 දෙනෙකුගෙන් එකතුව රු.88,602 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතු වේ. | හිඟ ණය ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) සභා බල ප්‍රදේශයේ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා හා නවාතැන් පොලවල්වලින් අය කරන සියයට 1 බදු ගෙවීම් පැහැර හරිනු ලැබූ | බදු ගෙවීම් පැහැර හැර ඇති ආයතන වෙත නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | කුඩා ලැගුම්හල් සහ විලා වශයෙන් පවතින අතර දැනට මෙම හෝටල් 10 අක්‍රීය තත්ත්වයේ |

| | | | |
|---|---|---|---|
| | ආයතන 10 ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | පවතින අතර, සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | සංචාරක මණ්ඩලයේ අනුමත ආයතනවලින් සියයට 1 බදු අය කිරීම සඳහා මුළු ආදායම තහවුරු කර ගැනීමට එම ආයතන විගණන වාර්තා මත තහවුරු වූ මූල්‍ය ප්‍රකාශන ලබා නොගෙන එක් එක් ආයතනය විසින් පිළියෙල කර දී තිබූ ආදායම් වාර්තා පදනම් කරගෙන බදු අයකර තිබුණි. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාගත හැකි වූ හෝටලයකින් පමණක් මුළු ආදායම මත බදු අය කිරීමේ දී තවදුරටත් රු.16,264,589 ක මුදලක් 2016 වර්ෂය හා 2017 වර්ෂය වෙනුවෙන් අයවිය යුතුව පැවතුණි. | විගණන වාර්තා මත ආදායම තහවුරු කරගෙන බදු අය කළ යුතු වේ. | 2019 වසරේ සිට විගණන වාර්තා මත බදු අයකරන බව හා මෙම ආයතනයට විරුද්ධව ඉදිරියේ දී නඩු තීන්දු මත කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.4.1 පවරා නොගත් වත්කම්**

--------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් අමාත්‍ය මණ්ඩල තීරණයක් ප්‍රකාරව හික්කඩුව නගර සභාව ගා/ මහාමායා විද්‍යාලය (පැරණි) පිහිටා තිබූ ඉඩමෙහි ඇති ගොඩනැගිල්ල තුළ සභාව ආරම්භයේ සිටම පවත්වාගෙන යනු ලබන නමුත්, මෙම ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2005 හා 2015 යන කාලපරිච්ඡේදයේදී විවිධ ආයතනවලින් සභාව වෙත ලැබී තිබුණු වාහන 09 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු කරමි. |

**3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව වාහන අළුත්වැඩියා කිරීමේ අංගනයක් පැවති නමුත්, වාහන අළුත්වැඩියාව සඳහා ස්ථිර කාර්මික නිලධාරියකු නොසිටීම නිසා 2019 ජනවාරි 21 දිනට වාහන 08 ක් ධාවනයෙන් ඉවත් කර අළුත්වැඩියාව සඳහා යොමුකර තිබුණ ද, අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකිව පැවතුණි. | කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදුකළ යුතු වේ. | ඉදිරියේ දී අළුත්වැඩියා කටයුතු සිදු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් රු.3,756,539 ක ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ නමුත්, එම මිලදී ගැනීම් සම්බන්ධව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයක රු.1,900,000 ක් වූ ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මෙ සම්බන්ධයෙන් සලකා බලමි. |
| | | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වියදම් විෂයයන් 03 ක එකතුව රු.14,699,585 ක් වූ ඉතිරිවීම් තිබූ අතර, එම අගයන් සියයට 28 සිට සියයට 87 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | වියදම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.5,920,885 ක් වූ අතර, එම වටිනාකම් සියයට 64 ත් සියයට 335 ත් අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී ඉලක්ක ආදායම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ආදායම් විෂයයන් 06 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම්වල එකතුව රු.21,552,331 ක් වූ අතර, එම වටිනාකම සියයට 21 සිට සියයට 88 දක්වා පරාසයක විය. | | |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේ දී විගණකාධිපතිවරයාගෙන් විමසීම් කර නොතිබුණි. අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

| | | |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සිදු කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | ඉදිරියේ දී කමිටු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. |